මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்தியமாகாணசபையின் அரசசேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොටපාර, මහනුවර
இல. 244,கடுகஸ்தொட்டைவீதி,கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: *www.psc.cp.gov.lk*

e-mail: *psc.cp.gov@gmail.com*

කාර්යාලය காரியாலயம் Office 081-2213097
ලේකම් செயலாளர் Secretary 081-2213096
වට්ස් ඇප් අංකය வட்ஸ்அப் இல. Whatsapp No 070-7213097
ෆැක්ස් பெக்ஸ் Fax 081-2213082

මගේඅංකය எனது இல. My No. CPC/PSC/2027/18/40
ඔබේඅංකය உமது இல Your No.
දිනය திகதி Date 2026.11. 17

මධ්‍යම පළාතේ,
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, සහා ලේකම්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
සියළුම ආයතන ප්‍රධානීන් වෙත,

මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණිය / කළමනාකරණ සේවා නිලධාරී සේවය සහ කාර්යාල සේවක සේවයේ නිලධාරීන් සඳහා වාර්ෂික ස්ථාන මාරු - 2027

මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණිය හා කාර්යාල සේවක සේවයේ නිලධරයන්ට අදාළ 2027 වසරේ වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධව අවසන් ස්ථාන මාරු නියෝග අපගේ නිල වෙබ් අඩවිය වන **www.psc.cp.gov.lk** හි පළකර ඇති අතර, අදාළ ලේඛන එමඟින් භාගත කරගන්නා ලෙස මෙයින් දන්වමි.

02. ඒ අනුව, මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත නිකුත් කළ මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක : GCP/02/AT-2027 හා 2026.06.26 දිනැති ලිපියේ සඳහන් නියෝගය පරිදි, සහ ගරු කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව **මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරීන්ගේ සහ කාර්යාල සේවක සේවයේ නිලධාරීන්ගේ 2027 වාර්ෂික ස්ථාන මාරු නියෝග 2027.01.01 දිනට නව සේවා ස්ථානයේ රාජකාරී භාර ගැනීමට හැකිවන පරිදි ක්‍රියාත්මක කළ යුතු බව කාරුණිකව දන්වමි.**

03. තවද, 2027.01.01 දින සිට ක්‍රියාත්මක වීමට නියමිත මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ 2027 වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීමේ දී ඇති විය හැකි පහත සඳහන් ප්‍රායෝගික ගැටළුකාරී තත්ත්වයන් සලකා බලා මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ 2027 වාර්ෂික ස්ථාන මාරු කල් දැමීමට මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක : GCP/02/AT-2027 හා 2026.11.13 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත.

I. මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ පවතින පුරප්පාඩු **242**ක් සඳහා විවෘත තරඟ විභාගය පවත්වා **2027** වර්ෂයේ පළමු කාර්තුවේදී බඳවා ගැනීමට කටයුතු සුදානම් කර ඇති අතර, එම නවක නිලධාරීන්, **2027** වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා දී ඇති ඇතැම් නිලධාරීන්ගේ අනුප්‍රාප්තිකයන් ලෙස නම් කර තිබීම.

II. ශ්‍රී ලංකා ගුරු සේවයට උපාධිධාරීන් බඳවා ගැනීමට පවත්වන ලද තරඟ විභාගයෙන් සමත් වූ පිරිස අතර **2027** වාර්ෂික ස්ථාන මාරු නියෝග ලද කළමනාකරණ සේවා නිලධාරීන්ද ඇතුළත් වන බවට තොරතුරු වාර්තා වී තිබීම.

04. එසේම පහත කරුණු කෙරෙහි **ඔබගේ විශේෂ අවධානය** යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

I. මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණිය හා **කාර්යාල සේවක සේවයේ** නිලධාරීන්ගේ අවසන් ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමාණවත් අනුප්‍රාප්තිකයන් ලබාදී නොමැති නම්, ඉදිරි නව බඳවා ගැනීමකදී හෝ අන්තර් පළාත් ස්ථාන මාරුවීම් මඟින් පැමිණීමට නියමිත නිලධාරීන් අනුප්‍රාප්තිකයන් ලෙස ලබාදීමට නියමිත බවත්, ඒ අනුව ස්ථාන මාරු නියෝග ලද නිලධාරීන් මුදාහැරීමට කටයුතු කිරීම.

II. සේවා අවශ්‍යතාවය මත ස්ථාන මාරු නියෝග දීර්ඝ කර ඇති නිලධාරීන් සඳහා සුදුසු නිලධාරීන් කඩිනමින් පුහුණු කර නියමිත දිනයේදී මුදාහැරීමට කටයුතු කිරීම.

III. මේ සමඟ ප්‍රකාශයට පත්කර ඇත්තේ, 2027 වාර්ෂික ස්ථාන මාරු අවසන් නියෝග (අභියාචනයන්ද සලකා බැලීමෙන් පසු) වන අතර, මේ සම්බන්ධයෙන් නැවත මෙම කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීමට කටයුතු නොකිරීම.

IV. 2027 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලේඛනයන්හි නම් සඳහන් නොවන, 2025 සහ 2026 වර්ෂයන්හි ස්ථාන මාරු නියෝග ලබා මේ දක්වා මුදාහැර නොමැති නිලධාරීන් සිටින්නේ නම්, එම නිලධාරීන්ද වහාම නව සේවා ස්ථාන වෙත මුදාහරින ලෙසත්, එම වර්ෂයන්හි ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් නැවත නැවතත් මෙම කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීමට කටයුතු නොකිරීම.

05. එම **වාර්ෂික ස්ථාන මාරු සඳහා මාර්ගගත ක්‍රමයට (Online)** තොරතුරු කැඳවීමේදී සම්බන්ධීකරණය සඳහා ඔබ විසින් පත් කරන ලද විෂය භාර නිලධරයා විසින්, **2027** වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව **ඔබ ආයතන වෙත සේවයට වාර්තා කර ඇති නිලධාරීන්ගේ** තොරතුරු පහත සඳහන් උපදෙස් අනුගමනය කර සම්පූර්ණ කළ යුතු වේ. **ඒ බව අදාළ විෂය භාර නිලධාරි දැනුවත් කරන ලෙසද වැඩිදුරටත් දන්වමි.**

I. මුලින්ම ඔබගේ ආයතනයේ Gmail නිල විද්‍යුත් තැපෑල වෙත පිවිසෙන්න.

II. **වාර්ෂික ස්ථාන මාරු සඳහා පමණක්** භාවිත අපගේ විද්‍යුත් තැපැල් ලිපිනය trans.psc.cp.gov@gmail.com මඟින් ඔබ ආයතනයේ විද්‍යුත් තැපෑල වෙත එවූ පහත සඳහන් **Google spreadsheet** වෙත පිවිසෙන්න.

- 2027 වාර්ෂික ස්ථාන මාරු - මධ්‍යම පළාත් කාර්යාල සේවක සේවයේ නිලධාරීන් (KKS) සේවයට වාර්තා කිරීම පිළිබඳ තොරතුරු ලේඛනය

III. එහි තොරතුරු ඇතුළත් කිරීමේදී Unicode (Iskoolapotha) අකුරු වර්ගය පමණක් භාවිත කළ යුතුය.

IV. ඉහත Google spreadsheet හි ඇති සේවයට වාර්තා කිරීම පිළිබඳ තොරතුරු හි ඔබගේ ආයතනයට පමණක් අදාළ ස්ථානයක් වෙන් කර ඇති අතර එහි අවසන් තීරු (column) 2 හි පමණක් අදාළ තොරතුරු නිවැරදිව ඇතුළත් කරන්න.

06. පූර්ව වර්ෂයන්හිදී වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව නව සේවා ස්ථාන වෙත සේවයට වාර්තා කරන නිලධාරීන්ගේ තොරතුරු අදාළ ආයතන විසින් මෙම Google spreadsheet හි නිසි පරිදි යාවත්කාලීන නොකිරීම තුල ඒ සම්බන්ධ තීරණ ගැනීමේදී මෙම කොමිෂන් සභාවට ගැටළුකාරී තත්වයන්ට මුහුණ දීමට සිදු වූ බැවින්, **වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව ඔබ ආයතනය වෙත සේවයට වාර්තා කරන නිලධාරීන්ගේ තොරතුරු මෙම Google spreadsheet හි 2027.01.31ට පෙර යාවත්කාලීන කිරීම අත්‍යවශ්‍ය වන අතර, වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීමේදී මෙම තොරතුරු භාවිතා කරන බැවින්, සියලුම ආයතන ප්‍රධානීන් මෙය ප්‍රමුඛ කාර්යයක් සේ සැලකිය යුතු බව ද කාරුණිකව දන්වමි.**

07. එම විස්තර ඇතුළත් Google spreadsheet හි ඔබ ආයතනයට අදාළ කොටසෙහි වාර්තාව පමණක් මුද්‍රණයකර (Print out) ආයතන ප්‍රධානියාගේ අත්සන සහිතව **2027.01.31** ට පෙර තැපෑල මඟින් මෙම කොමිෂන් සභාව වෙත එවිය යුතුය.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි,

කේ.කේ.ජී.අයි.ඩී.ඒ. විජේතිලක
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

කේ.කේ.ජී.අයි.ඩී.ඒ. විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

පිටපත් :

1. ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, මධ්‍යම පළාත - කරු.දැ.ගැ.ස සහ අ.ක.ස
2. විගණකාධිපති - අ.ක.ස.